මෛත්‍රීපාල සිරිසේන
MAITHRIPALA SIRISENA
மைத்ரிபால சிறிசேன

හයවන විධායක ජනාධිපති
6 வது நிறைவேற்று இலங்கை ஜனாதிபதி
THE 6TH EXECUTIVE PRESIDENT

2024 ජූලි මස 27 වන දින

විශේෂ නිවේදනයයි!

සියලුම දේශපාලන මණ්ඩල සභිකයින්, මධ්‍යම කාරක සභිකයින්, විධායක සභිකයින්, සමස්ත ලංකා කාරක සභිකයින්, අනුබද්ධ සංවිධාන නායකයින්, දිස්ත්‍රික් නායකවරුන් හා ආසන/ දිස්ත්‍රික් සංවිධායකවරුන් වෙත.

පාර්ලිමේන්තු මන්ත්‍රී දයාසිරි ජයසේකර මහතා මාධ්‍ය වෙත අදහස් දක්වමින් ඊයේ එනම් 2024.07.26 වන දින සිදුකල ප්‍රකාශය මම පිළිකුලෙන් යුක්තව හෙළා දකින අතර සම්පූර්ණයෙන්ම ප්‍රතික්ෂේප කරමි. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ වත්මන් අර්බුදකාරී තත්ත්වයට එකම වගකිවයුත්තා මා බව හුවා දක්වමින් දයාසිරි ජයසේකර මහතා කළ ප්‍රකාශය මුළුමනින්ම සාවද්‍යය. ඒ ගැන දීර්ඝ වශයෙන් කරුනු දැක්වීමට මම බලාපොරොත්තු නොවෙමි.

ජනාධිපති අපේක්ෂක ආචාර්ය විජයදාස රාජපක්ෂ මහතා ශ්‍රී ලංකා නිදහස් පාක්ෂිකයකු නොවන බවත්, එතුමා අප පක්ෂයේ අපේක්ෂකයා වශයෙන් ඉදිරිපත් කිරීමට කිසිදු තීරණයක් ගෙන නොමැති බවත් දයාසිරි ජයසේකර මහතා සඳහන් කළේය. මෙම කරුණු මුලුමනින්ම සත්‍යය විකෘති කිරීමකි. ආචාර්ය විජයදාස රාජපක්ෂ මැතිතුමා දේශපාලනයට පිවිසෙන්නේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයෙන් වන අතර, 2006-2007 වකවානුවේදී මහින්ද රාජපක්ෂ ආණ්ඩුව විසින් එතුමා නෙරපා හරින්නේ ආන්ඩුවේ මහාපරිමාන වංචා,දූෂණ හා රාජ්‍ය දේපොල අවභාවිතාවීමට විරුද්ධවීම නිසාවෙන් බව සිහිපත් කරනු කැමැත්තෙමි. ආචාර්ය විජයදාස රාජපක්ෂ යනු කවදත් සිය පෞද්ගලික දේශපාලන වාසි ප්‍රයෝජන පසෙකලා සාධාරණත්වය හා යුක්තිය වෙනුවෙන් පෙනී සිටි ජ්‍යෙෂ්ඨ දේශපාලනඥයෙකි.

එසේම රනිල් වික්‍රමසිංහ ජනාධිපතිවරයාට ඉදිරි ජනාධිපතිවරණයේදී සහය දීම සඳහා අවස්තාවාදී අතලොස්සක් දෙනා සිදුකරමින් සිටින කුමන්ත්‍රණයට එරෙහිව සැබෑ ශ්‍රී ලංකා නිදහස් පාක්ෂිකයාගේ ජනාධිපති අපේක්ෂකයා ලෙස ආචාර්ය විජයදාස රාජපක්ෂ මැතිතුමා යෝජනා ස්ථිර කරනු ලැබ ඒකමතිකව සම්මත කරනු ලැබුයේ අප පක්ෂයේ විධායක සභාව විසින් බවද මතක් කර දෙනු කැමැත්තෙමි. ආචාර්ය විජයදාස රාජපක්ෂ මැතිතුමා අප පක්ෂයේ වැඩබලන සභාපතිවරයා ලෙස විධායක සභාව විසින් පත් කිරීමට පෙරාතුව පක්ෂ සාමාජිකත්වය ව්‍යවස්ථානුකූලව එතුමා වෙත ප්‍රදානය කිරීමද සිදුවූ බවත් අවධාරණය කරමි.

ඊයේ මාධ්‍ය වෙත අදහස් දක්වමින් දයාසිරි ජයසේකර මහතා ප්‍රකාශ කළේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ඉදිරි වසර පහකටවත් ගොඩගත නොහැකි බවත් එනිසා කවුරුන් හෝ අපේක්ෂකයකුට සහය දිය යුතු බවත්ය. ඒ අනුව එතුමා සූදානම් වන්නේ කුමක් සඳහා දැයි ඉතාම පැහැදිලිය.

අද දින දයාසිරි ජයසේකර මහතා විසින් සංවිධායකවරුන් කැඳවා ඇති අතර, ඒ සඳහා නොපැමිනෙන්නැයි මට දැනුම් දුන්නේ ය. එක් පිරිසක් ශ්‍රී ලංකා නිදහස් පක්ෂය රනිල් වික්‍රමසිංහ ජනාධිපතිවරයාට වෙන්දේසි කිරීමට උත්සහ දරන අතර තවත් පිරිසක් තම පෞද්ගලික දේශපාලන වාසි සඳහාම පමණක් අප පක්ෂය සමගි ජන බල වේගයට පාවාදීමට කටයුතු කරන බව ඉතාමත් පැහැදිලිය. ඉදිරි අගෝස්තු 08 වන දින සමගි ජන බලවේගය සමග එක්වීමට දයාසිරි ජයසේකර මහතා ඇතුළු පිරිසක් මේ වනවිටත් ගිවිසුම්ගතවී සිටින අතර ඒ සම්බන්ධයෙන් ඇතිකරගෙන තිබෙන එකඟතා හැකි නම් අනාවරණය කරන්නැයි මම එතුමාට අභියෝග කරමි.

අංක - සී/79, හෙක්ටර් කොබ්බෑකඩුව මාවත, කොළඹ 07.
C/79 ஹெக்டர் கொப்பேகடுவ மாவதா கொழும்பு 07.
No - C/79. Hector Kobbekaduwa Mawatha, Colombo 07.
Tele. No./දුරකථන - 0112081225 / 6 Fax No/ෆැක්ස් 0112081229
Email/විද්.තැපැල් - info.maithripalasirisena@gmail.com
නව නගරය පාර, පොළොන්නරුව.
புதிய நகர வீதி பொலன்னறுவை.
New Town Road, Polonnaruwa.
Tele. No./දුරකථන - 0272222301 Fax No/ෆැක්ස් - 0272223901

වත්මන් සමාජ දේශපාලන හා ආර්ථික අර්බුදය කළමනාකරණය කිරීමට සුදුසුම පුද්ගලයා වන ආචාර්ය විජයදාස රාජපක්ෂ මහතා ජයග්‍රාහී අපේක්ෂකයා ලෙසින් අප ඉදිරිපත් කර ඇති තත්ත්වය තුළ විවිධ පුද්ගලයින් මාධ්‍ය ඔස්සේ සමාජගත කරන සාවද්‍ය හා අවස්ථාවාදී ප්‍රකාශ වලට නොරැවටී බුද්ධිමත්ව කටයුතු කරන්නැයි කාරුණිකව දන්වා සිටිමි.

මෛත්‍රීපාල සිරිසේන
පාර්ලිමේන්තු මන්ත්‍රී
6 වන විධායක ජනාධිපති
ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ හිටපු සභාපති